#mediaethicsSL #Sinhalapress #lka #Mawbima

පුද්ගලයෙකුගේ ශාරීරික හෝ මානසික රෝගාබාධ පිළිබඳව අගති සහගත හා අවඥාසහගත කරුණු සඳහන් කිරීමෙන් පුවත්පත් වැළැකිය යුත්තේය යනුවෙන්, ශ්‍රී ලංකා කර්තෘ සංසදය මගින් හඳුන්වා දුන් වෘත්තිය ප්‍රතිපත්ති මාලාවේ සඳහන් වේ. කෙසේ වුවත් මව්බිම පුවත්පතේ සඳහන් වන පහත ප්‍රවෘත්තිය නිරීක්ෂණය කළ විට, එම ආචාර ධර්මය සැලකිල්ලට ගැනී ඇතිදැයි සිතා බැලීමට සිදුවේ. මෙම ප්‍රවෘත්තියේ සිරස්තලයේ "පිස්සෙක්" යනුවෙන් සඳහන් වී ඇති නමුත්, ප්‍රවෘත්තියේ අන්තර්ගතය තුළ "මානසික රෝගියෙකු" ලෙසින් වඩාත් නිවැරදිව සිදුවීමට අදාළ පුද්ගලයාව හඳුන්වා ඇත. පිස්සෙක් යන පදය පොදුවේ සමාජය තුළ භාවිතා වන්නේ අගති සහගත, කොන්කිරීමේ ස්වරයකින් වේ. එසේ තිබියදී, මෙම ප්‍රවෘත්තියේ සිරස්තලයේද "මානසික රෝගී පුද්ගලයෙක්" යන්න හෝ ඊට සමාන වඩාත් නිවැරදි හැඳින්වීමක් අන්තර්ගත නොවූයේ මන්ද? මේ පිළිබඳව ඔබගේ අදහස කුමක්ද?